සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8575

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම:-.............................................. විභාග අංකය:-..............................................

සැලකිය යුතුයි.
- I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I පත්‍රය

- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.
(මහනුවර, රත්නපුර, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ග්‍රාම නිලධාරි කොට්ඨාසය, වයඹ, ඊසාන, ගාල්ල)

01. පාසල පිහිටා ඇති කුඩා ම පරිපාලන ඒකකය .................................................. යි.

02. .................................................. සබරගමුව පළාතට අයත් ප්‍රධාන නගරයකි.

03. බටහිර හා උතුරු දිශාව අතර පිහිටි අනු දිශාව වන්නේ .................................................. දිශාවයි.

04. මධ්‍යම පළාතට .................................................. දිස්ත්‍රික්කය අයත් වේ.

05. ලන්දේසි බලකොටුව, වරාය, ප්‍රදීපාගාරය වෙරළ තීරයේ පිහිටීම නිසා .................................................. නගරය ඉතා වැදගත් වේ.

- අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට ඉතා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06. කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇති ඉතා වැදගත් තොරතුරු අපට ලබාදෙන රාජ්‍ය ආයතනයකි.
1. අධ්‍යාපන දෙපාර්තමේන්තුව
2. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
4. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

07. පාරම්පරික ශිල්පඥානය පදනම් කරගෙන කරනු ලබන වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ වූ ප්‍රදේශයකි.
1. අම්බලන්ගොඩ
2. පිළිමතලාව
3. රදාවඩුන්න
4. දුම්බර

08. ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් වෙන්වන පටු මුහුදු තීරය
1. මලක්කා සමුද්‍ර සන්ධිය
2. මැගලන් සමුද්‍ර සන්ධිය
3. පෝක් සමුද්‍ර සන්ධිය
4. බීජිං සමුද්‍ර සන්ධිය

09. අප ලබා ගන්නා සියලුම බලශක්තිවල මූලික ප්‍රභවය වන්නේ

1. ඛනිජතෙල් ය.
2. සූර්යයා ය.
3. විදුලිය ය.
4. ස්වාභාවික ගෑස් ය.

10. බස්නාහිර හා දකුණු පළාතට මෝසම් වැසි ලබාදෙමින් සුළං හමා එන දිශාව වන්නේ

1. නැගෙනහිර ය.
2. වයඹ ය.
3. නිරිත ය.
4. උතුර ය.

● අංක 11 - 15 දක්වා ප්‍රකාශ හරිනම් "✓" ලකුණ ද වැරදි නම් "X" ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11. අව්ච්චියා සංචාරක පක්ෂියෙකි. (..........................)

12. යම් කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය දේශගුණය නම් වේ. (..........................)

13. නිවැරදි දිශාව සොයා ගැනීමට මාලිමාව ප්‍රයෝජනවත් ය. (..........................)

14. තෛපොංගල් උත්සවය ඉස්ලාම් බැතිමතුන් විසින් සමරනු ලැබේ. (..........................)

15. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන නගරය යි. (..........................)

● අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පහත සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.




16. ශ්‍රී ලංකාව .................................................. අක්ෂරයෙන් දැක්වේ.

17. ආසියා මහාද්වීපය දක්වෙන්නේ .................................................. අක්ෂරයෙනි.

18. ඕස්ට්‍රේලියාව .................................................. අක්ෂරයෙන් දක්වා ඇත.

19. සමකය දක්වෙන්නේ .................................................. අක්ෂරයෙනි.

20. අප්‍රිකා මහාද්වීපය .................................................. අක්ෂරයෙන් දක්වා ඇත. (ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්නවලින් හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. (i) ඔබේ පාසල පිහිටි ගම හෝ නගරය නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබේ පාසල අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසය ලියා දක්වන්න. (ලකුණු 02)

(iii) ඔබේ පාසල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) ඔබේ පාසල පිහිටි දිස්ත්‍රික්කය ලියා දක්වන්න. (ලකුණු 02)

(v) ඔබේ පාසල පිහිටි පළාත නම් කරන්න. (ලකුණු 02)

(vi) ඔබේ පාසල අවට පිහිටි පොදු ස්ථාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 16)

02. (i) කාලගුණික අංග අතර මූලිකාංගය වන්නේ කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත කාලගුණික අංග මනිනු ලබන උපකරණ A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.

A - වර්ෂාපතනය

B - උෂ්ණත්වය

C - සුළඟේ වේගය

D --සුළං හමන දිශාව (ලකුණු 04)

(iii) වර්ෂාව ඇතිවීමට පෙර පරිසරයේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ද වර්ෂාව මගින් අපට ලැබෙන ප්‍රයෝජන තුනක් ද ලියා දක්වන්න. (ලකුණු 05)

03. (i) ශාකවලින් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් සතුන් ගෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන එක බැගින් සඳහන් කරන්න.

A - ඇටි කුකුළා -

B - වවුලා -

C - බත්කූරා -

D - ගැඩවිල් පණුවා (ලකුණු 04)

(iii) ඔබේ ප්‍රදේශයේ ප්‍රජාවගේ දියුණුව උදෙසා පිහිටුවා ගෙන ඇති සමිති සමාගම් තුනක් නම් කර, ඒවායින් ඉටු කෙරෙන කාර්යයන් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 05)

04. (i) භූමිය විවිධ අයුරින් ප්‍රයෝජනයට ගනු ලබන ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) භූමිය අවිධිමත්ව පරිහරනය කරනු ලබන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) අවිධිමත්ව භූමිය පරිහරණය කිරීම නිසා ඇති වී තිබෙන පාරිසරික ගැටලු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) ජලය දූෂණය වන ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජලය හිඟවීමෙන් ඇතිවිය හැකි ගැටලු හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ජලය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගත හැකි පියවර පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

06. (i) වායුගෝලයේ පවත්නා වායු වර්ග අතුරින් ශ්වසනයට අවශ්‍ය වායුව සහ ශාක වර්ධනයට අවශ්‍ය වායුව පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) වායුව දූෂණයට ලක්විය හැකි අවස්ථා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වායුව දූෂණය නිසා

(a) ශ්වසන පද්ධතිය ආශ්‍රිතව ඇතිවන රෝග තුනක් ද,

(b) අම්ල වැසි නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල දෙකක් ද පිළිවෙලින් ලියන්න. (ලකුණු 05)

07. (i) බලශක්ති ඉල්ලුම ඉහළ යාමට හේතු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) නිවසේ බලශක්තිය අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පරිසරයට හානි නොවන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ඒවායින් ගත හැකි ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 05)